# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1973/4 - 2016 ජුනි මස 27 වැනි සඳුදා - 2016.06.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/KGK/4/2/2011/02/26.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2012/WS/108.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :-*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලගම්මැද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද, 2016.05.04 දිනැති කැඩැස්තර සිතියම් අංක 320390, කලාප 4 න් 2 වැනි කලාපයේ පත්‍ර අංක 5 දරන පිඹුරේ කැබලි අංක 222 සහ 223 වශයෙන් දැක්වෙන "වැමුල්ල වත්ත" නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0158 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක -

**කැබලි අංකය 222**

**ඉඩමේ නම: වැමුල්ල වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0030.**

මායිම් —:

*උතුරට* : කැබලි අංක 208 සහ 212; *නැගෙනහිරට* : කැබලි අංක 223 සහ 224; *දකුණට* : කැබලි අංක 224; *බටහිරට* : කැබලි අංක 224 සහ 210.

හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :

1. එස්. දාබරේ මහතා, අංක 339/6, වැමුල්ල වත්ත, අම්පිටිය.

**කැබලි අංකය 223**

**ඉඩමේ නම: වැමුල්ල වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0005.**

මායිම් —:

*උතුරට* : කැබලි අංක 212; *නැගෙනහිරට* : කැබලි අංක 224; *දකුණට* : කැබලි අංක 224; *බටහිරට* : කැබලි අංක 222සහ 208.

හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :

1. සී. කේ. ඩී. විතානගේ මහතා, අංක 339/4, වැමුල්ල වත්ත, අම්පිටිය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2016

අගෝස්තු මස 30 වැනි දින පෙ.ව. 10.00ට මහනුවර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 අගෝස්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර සහ ගඟවට කෝරළේ.

2016 ජුනි මස 21 වැනි දින.
මහනුවර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

07 - 541

**සංශෝධනයයි**

**ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : නුඑ/3/1/8/අත්පත්/150.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2012/ඩබ් එස්/376.

අංක 1957/2 හා 2016.03.08 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ 1 ඒ පිටුවේ 2 වැනි ඡේදයේ ප්‍රමාණය හෙක්ටයාර් 64.5677 වෙනුවට හෙක්ටයාර් 0.1276 ලෙස මෙයින් සංශෝධනය කරන අතර ,අනු අංක 2 හි සඳහන් විස්තර මෙයින් ඉවත් කරමි.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2016 ජුනි මස 16 වැනි දින.
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 542

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.